# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## වර්ෂ අවසාන ඇගයීම - 2002
## ගණිතය

**6 ශ්‍රේණිය** **කාලය: පැය 02 යි.**

**නම/විභාග අංකය:** ..............................................................................................................

### I කොටස

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
I කොටසට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
II කොටසට පිළිතුරු වෙනත් කොළයක ලියා අමුණන්න.




(1) සාධක ගසින් දක්වෙන සංඛ්‍යාව මින් කවරක්දැයි තෝරා යටින් ඉරක් අඳින්න.
- (i) ඔත්තේ සංඛ්‍යාවකි.
- (ii) ප්‍රථමක සංඛ්‍යාවකි.
- (iii) සංයුක්ත සංඛ්‍යාවකි.

(2) $5^3$ විහිදුවා ලියන්න. ......................................................

(3) ගණිතය ප්‍රශ්න පත්‍රයක දී නිමල් ලබාගත් ලකුණු ගණන, අරුණි ලබාගත් ලකුණු ගණනට වඩා අඩු ය. වින්ධ්‍යාගේ ලකුණු ගණන, අරුණිගේ ලකුණු ගණනට වඩා වැඩි ය.
වැඩියෙන් ම ලකුණු ලබා ගත්තේ කවුරුන් ද? ..........................................................

(4) ගුණ කරන්න. 35 × 40

.........................................................................................................................................

(5) වරහන් තුළ ඇති පදවලින් සුදුසු පදය තෝරා හිස්තැනට යොදන්න.
අඩුම පාද ගණනකින් යුත් සංවෘත රූපය ...................................................... වේ.
(සෘජුකෝණාස්‍රය, සමචතුරස්‍රය, ත්‍රිකෝණය)

(6) පහත ඇති සංඛ්‍යා අතුරින් 2 න් හරියටම බෙදිය හැකි සංඛ්‍යා තෝරා ඒවා යටින් ඉරි අඳින්න.
- (i) 75
- (ii) 40
- (iii) 378
- (iv) 221

(7) AB හි දිග නිමානය කළ විට,
සෙන්ටි මීටර ........................................................... පමණ වේ.




(8) සෘජුකෝණාස්‍රාකාර පාත්තියක දිග 5m ද පළල 2m ද වේ. එහි වර්ග ඵලය වර්ග මීටර් කීයද?

(9) සත්‍ය ප්‍රකාශනයක් ලැබෙන පරිදි < හෝ > ලකුණ යොදන්න.
3kg 200g ................................ 2kg 700g

(10) 3, 8, 5, 6 යන ඉලක්කම් හතර ම භාවිත කොට ලිවිය හැකි ඉලක්කම් හතරේ විශාලතම සංඛ්‍යාව ලියන්න.

.......................................................................

(11) රූපයේ අඳුරු කර ඇති භාගය ලියන්න. ..............................



(12) 56mm, සෙන්ටි මීටර හා මිලි මීටරවලින් ලියන්න. ..............................

(13) 1 ට $\frac{1}{5}$ ඒවා කීයක් තිබේ ද? ..............................

(14) සිසුන් හතර දෙනෙකු 1 සහ 10 අතර වූ සෘජුකෝණාස්‍ර සංඛ්‍යා ලියා දක්වා තිබූ ආකාරය මෙසේ ය.

සමන් → 2, 4, 6, 8
පියුමි → 4, 6, 8, 9
වරුණි → 2, 3, 5, 7
උපුල් → 1, 4, 9

මෙම පිළිතුරු අතුරින් නිවැරදි පිළිතුර දක්වා ඇත්තේ කවුරුන් ද? ..............................

(15) 0.37 දශම සංඛ්‍යාව, භාගයක් ලෙස දක්වන්න. ..............................

(16) ගණිතය පෙළ පොතෙහි දිග, පළල රූප සටහනෙහි දක්වා ඇත. එහි දිග හා පළල අතර අනුපාතය සරල ම ආකාරයෙන් ලියන්න. ..............................




(17) පහත ඇති භාග අතුරින් වඩා විශාල භාගය යටින් ඉරක් අඳින්න.

$\frac{1}{8}$, $\frac{1}{2}$, $\frac{1}{5}$, $\frac{1}{10}$

(18) හිස් කොටුවලට ගැලපෙන සංඛ්‍යා ලියන්න.

$$\frac{4}{7} = \frac{\square}{14} = \frac{16}{\square}$$

To download past papers visit
www.vajirapani.blogspot.com

(19) පංතියක සිටින සිසුන් සංඛ්‍යාව 40 කි. එක් වැසි දිනක දී පංතියට නොපැමිණි සිසුන් සංඛ්‍යාව x වේ. එදින පාසලට පැමිණි සිසුන් සංඛ්‍යාව දක්වීමට x අඩංගු ප්‍රකාශනයක් ලියන්න ..............................

(20) පහත ඇති දශම සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට ලියන්න.

1.00, 0.01, 0.10 ..............................

## II කොටස

**ප්‍රශ්න 6 කට පිළිතුරු ලියන්න.**

(1) (අ) 8265457 සංඛ්‍යාව රූප සටහනේ හිස්කොටුවලට යොදන්න. ඉදිරියේ ඇති හිස්තැන් පුරවන්න.




(ආ) 7936 සංඛ්‍යාවෙහි
(i) 3 න් නිරූපණය වන අගය ලියන්න.
(ii) 7 න් නිරූපණය වන අගය ලියන්න.
(iii) 3 න් නිරූපණය වන අගය 6 න් නිරූපණය වන අගය මෙන් කී ගුණයක් ද?

(2) හිස් කොටුවලට ගැලපෙන ඉලක්කම් ලියන්න.

(i)
$$\begin{array}{r} \square\ 9\ 5 \\ +\ 3\ 6\ \square \\ \hline 7\ \square\ 7 \\ \hline\hline \end{array}$$

(ii)
$$\begin{array}{r} 7\ 3 \\ -\ \square\ \square \\ \hline 2\ 9 \\ \hline\hline \end{array}$$

(3) (අ) (i) යම් ස්ථානයක උතුරු දිශාව සොයා ගැනීම සඳහා භාවිත කළ හැකි උපකරණයක් නම් කරන්න.

(ii) ශිෂ්‍යයකු දකුණු දිශාවට මුහුණ ලා සිටගෙන සිටී. එම ශිෂ්‍යයාගේ වම් අත පිහිටන්නේ කවර දිශාවෙහි ද?

(iii) මෙම සටහන පිටපත් කරගන්න. මෙහි ප්‍රධාන දිශා 4 සටහන් වේ. අනු දිශා 4 හි නම් ලියන්න.




(ආ) සවිධි චතුස්තලයක් මේසයක් මත තැබූ විට ඇල මුහුණත් කීයක් දකින්නට ලැබේ ද?

(4) (අ) (i) මෙම සංඛ්‍යා රේඛාව පිටපත් කරගන්න.




(ii) මෙම සංඛ්‍යා රේඛාව මත 10 ට අඩු ප්‍රථමක සංඛ්‍යා ප්‍රස්තාරගත කරන්න.

(ආ) 15 සාධක දෙකක ගුණිතයක් ලෙස $15 = 3 \times 5$

$1 \times 15$ දැක්විය හැක.

එලෙස 12, සාධක දෙකක ගුණිතයක් ලෙස දැක්විය හැකි ආකාර සියල්ලම ලියන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

(5) (i) මෙම රූපය හොඳින් බලන්න. දිග සඳහන් නොකර ඇති පැති 3 හි දිග ලියන්න.




(ii) මුළු රූපයේ පරිමිතිය ලියන්න.

(iii) මෙම රූපය ඇසුරෙන් වර්ගඵලය $30cm^2$ ක් වූ සෘජුකෝණාස්‍රයේ දිග ලියන්න. පළල ලියන්න.

(6) මෙම මිල දර්ශනය අනුව පහත දැක්වෙන බිල් පත්‍රය සකස් කරන්න.

| | | රු. ශත. |
|---|---|---|
| සම්බා හාල් | 1kg | 33. 00 |
| සීනි | 500g | 16. 00 |
| තේ කොළ | 100g | 24. 00 |
| මයිසූර් පරිප්පු | 1kg | 56. 00 |
| බී ළූණු | 1kg | 32. 00 |
| දිය ලුණු පැකට් | 1 | 10. 00 |
| වියළි මිරිස් | 500g | 70. 00 |
| ගිනි පෙට්ටි | 1 | 2. 00 |

| | | රු. | ශත. |
|---|---|---|---|
| සම්බා හාල් | 3kg | .............. | .......... |
| වියළි මිරිස් | 250g | .............. | .......... |
| මයිසූර් පරිප්පු | 500g | .............. | .......... |
| ගිනි පෙට්ටි | 6 | .............. | .......... |
| තේ කොළ | 50g | .............. | .......... |
| සීනි | 500g | .............. | .......... |
| මුළු එකතුව | | | |

(7) (අ) රූපයේ දැක්වෙන්නේ ඉරට්ට සංඛ්‍යා දැක්වෙන රටාවකි. මෙහි 4 වැනි ඉරට්ට සංඛ්‍යාව $2 \times 4$ ලෙස දැක්විය හැක.




(i) මෙහි පළමු වැනි ඉරට්ට සංඛ්‍යාවේ රටාව ලියන්න.

(ii) 17 වන ඉරට්ට සංඛ්‍යාව දැක්වෙන රටාව ලියන්න.

(ආ) (i) මෙම තිත් රටාව පිටපත් කර ගන්න. මෙහි කොටුකර ඇත්තේ ත්‍රිකෝණ සංඛ්‍යාවකි. එම සංඛ්‍යාව ලියන්න.

(ii) ඔබ ලකුණු කරගත් තිත් මත සමචතුරස්‍ර සංඛ්‍යාවක් කොටුකර පෙන්වන්න.

(iii) එහිම සෘජුකෝණාස්‍ර සංඛ්‍යාවක් කොටුකර පෙන්වන්න.



To download past papers visit
www.vajirapani.blogspot.com

(8) (අ)




(i) මෙම රූපය ඇසුරෙන් සවිධි රූප වල නම් ලියන්න.

(ii) සවිධි නොවන රූපවල නම් ලියන්න.

(ආ) දී ඇති ප්‍රකාශනය හරි නම් √ ලකුණු ද, වැරදි නම් X ලකුණු ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(i) ඕනෑම ත්‍රිකෝණයකට කෝණ 3 ක් ඇත. ( )

(ii) සෘජුකෝණාස්‍රයක සියලු ම පාද සමාන වේ. ( )

(iii) ඝනකයක මුහුණත් 6 ක් ඇත. ( )

(iv) සැමන් මාලු ටින් එකක වක්‍ර පෘෂ්ඨ පමණක් ඇත. ( )

(v) අවකාශයේ ඉඩක් ගන්නා වස්තු ඝන වස්තු ලෙස හැඳින් වේ. ( )

(vi) රබර් බෝලයක පෘෂ්ඨය, වක්‍ර පෘෂ්ඨයකි. ( )

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | සංයුක්ත සංඛ්‍යාවකි | (2) | 5 x 5 x 5 | (3) | වින්ධ්‍යා | (4) | 1400 |
| (5) | ත්‍රිකෝණය | (6) | 40 , 378 | (7) | 5cm | (8) | $10m^2$ |
| (9) | 3kg 200g > 2kg 700g | (10) | .8653 | (11) | $\frac{1}{4}$ | (12) | 5cm 6mm |
| (13) | 5 | (14) | පියුම් | (15) | $\frac{37}{100}$ | (16) | 4 : 3 |
| (17) | $\frac{1}{2}$ | (18) | $\frac{4}{7} = \frac{\boxed{8}}{14} = \frac{16}{\boxed{28}}$ | (19) | 40 - x | (20) | 0.01, 0.10, 1.00 |

## II කොටස

**(1)** (අ)




(ආ) (i) 30 (ii) 7000 (iii) 5

**(2)** (i)

$$\begin{array}{r} \boxed{3}\;9\;5 \\ +\;\;3\;6\;\boxed{2} \\ \hline 7\;\boxed{5}\;7 \\ \hline\hline \end{array}$$

(ii)

$$\begin{array}{r} 7\;3 \\ -\;\boxed{4}\boxed{4} \\ \hline 2\;9 \\ \hline\hline \end{array}$$

**(3)** (අ) (i) මාලිමා යන්ත්‍රය (ii) නැගෙනහිර

(iii)




(ආ) 3

**(4)** (අ)




(ආ) 12 = 1 x 12 , 2 x 6 , 3 x 4
12 x 1, 6 x 2, 4 x 3

**(5)** (i)




(ii) 40cm
(iii) දිග 10 cm, පළල 3cm

**(6)**

| | | රු. | ශත |
|---|---|---|---|
| සම්බා හාල් | 3kg | 99 | 00 |
| වියළි මිරිස් | 250g | 35 | 00 |
| මයිසූර් පරිප්පු | 500g | 28 | 00 |
| ගිනි පෙට්ටි | 6 | 12 | 00 |
| තේ කොළ | 50g | 12 | 00 |
| සීනි | 500g | 16 | 00 |
| මුළු එකතුව | | 202 | 00 |

**(7)** (අ) (i) 2 x 1 (ii) 2 x 17

(ආ) (i) 6




**(8)** (අ) (i) A සමචතුරස්‍රයකි B සම පාද ත්‍රිකෝණයකි

(ii) C පාද අසමාන චතුරස්‍රය
D සෘජු කෝණාස්‍රය

(ආ) (i) ✓ (ii) X (iii) ✓
(iv) X (v) ✓ (vi) ✓